මගේ අංකය : JSC/SCE/CIR/2025

සියළුම අධිකරණ නිලධාරීන් වෙත,

<u>නිල නිවාස පරීක්ෂා කිරීම සඳහා අවසර ලබාදීම පිළිබඳවයි.</u>

අධිකරණ නිලධාරීන් වෙත පවරා ඇති යුක්තිය පසඳලීමේ හා අධිකරණමය බලතල ක්‍රියාත්මක කිරීමේ වගකීම මෙන්ම ඔවුන්ගේ නිල භූමිකාව තුල ඔවුන් වාසය කරන නිල නිවාස හා එයට අයත් භූමියද අවට පරිසරයද මනා ලෙස පිරිසිදුව හා නිසා කළමනාකාරීත්වයකින් නඩත්තු කොට පවත්වාගෙන යාමේ වැදගත්කම අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට ලක් වී ඇත. එය නිරීක්ෂණය කරනු ලබන පොදු මහජනතාවගේ දෘෂ්ටිකෝණයට අනුව වෘත්තීය ගරුත්වය ප්‍රකට කරන හා විදහා දක්වන ගෞරවණීය ස්ථානයක් වශයෙන් නිල නිවාස සහ භූමිය නඩත්තු කිරීමේ වගකීම උද්ගත වේ.

02. නිල නිවාසවල දොරවල්, ජනෙල්, වහලවල්, නිවසේ බිම, මිදුල හා අවට පරිසරය නිතිපතා පිරිසිදු කිරීමක් සිදු නොවන බවටද, නිල නිවාසවල ඇතැම් කාමර භාවිතයට ගැනීමකින් හෝ පිරිසිදු කිරීමකින් තොරව අත්හැර දමා පවතින බවටද වාර්තා වී ඇත. විශේෂයෙන්ම විදුලි උපාංග නිසි පරිදි නඩත්තුවකින් තොරව හා ඒවායේ පවතින දෝෂ යථා තත්වයට පත් කිරීමකින් තොරව දීර්ඝ කාලයක් පැවතීම මත ඒවා පිළිසකර කිරීමේ වියදම අධික වන බවටත්, ඇතැම් අවස්ථාවල නිල නිවාසවල ජීවත්වන විනිසුරුවරයාගේ හා පවුලේ අයගේ ජීවිත ආරක්ෂාව පවා තර්ජනයට ලක්වන ආකාරයේ නොසැලකිලිමත්ව විදුලි උපාංග අනාරක්ෂිතව පවතින බවටත් කරුණු ඉදිරිපත්ව ඇත.

03. නිල නිවාසවලට සපයා ඇති උපකරණ, යන්ත්‍රසූත්‍ර, ලී බඩු ආදිය සම්බන්ධයෙන් නිසි පරීක්ෂාවකින් කටයුතු නොකිරීමද අවධානයට ලක්ව ඇත. නියමිත කාල පරතරයක් සහිතව තීන්ත ආලේප කිරීම සිදු නොකිරීම මත නිල නිවාසවල බිත්ති, තාප්ප ආදිය ගරා වැටීමකට ලක් වන බවටත්, ඒවායේ ගස් පැලවීම් ආදිය මුල් අවස්ථාවේදී නිරීක්ෂණය කොට පිළියම් නොයෙදීම මත පසු කාලයකදී අධික වියදමක් දරා ඒවා පිළිසකර කිරීමට සිදු වන බවටත් කරුණු ඉදිරිපත් වේ. එසේම වහලේ වැහි පීලි පිරිසිඳු නොකිරීම නිසා එකී පීලි සිරවීම මත මදුරුවන් බෝවීම නිසා විනිසුරුවරයාගේ සහ අවට වෙසෙන්නන්ගේ සෞඛ්‍යට තර්ජනයක්ද සිදු වන බවට පෙනී යයි.

04. ඉහත දක්වන ලද කරුණු සහ ගරු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට ලක්ව ඇති ආනුෂාංගික කරුණු සියල්ල සැලකිල්ලට ගනිමින්ද, රජය විසින් සපයා ඇති නිල නිවාස නඩත්තු කිරීම සඳහා විශාල මහජන බදු මුදලක් වැයවීමද, ඒවා නිසි පරිදි නඩත්තු නොකිරීම මත එකී බදු මුදල් අපතේ යාමද, වෘත්තීය ගරුත්වය පවත්වාගෙන යාමේදී සිදුවන බාධාවන් සැලකිල්ලට ගනිමින්ද අධිකරණ නිලධාරීන් විසින් නිල නිවාස හා අවට පරිසරය (මායිම් තාප්පද ඇතුලුව) පිරිසිදුව හා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා වහාම කටයුතු කිරීමේ වගකීම අධිකරණ නිලධාරීන් වෙත සිහි කැඳවීමක් සිදු කරනු ලබයි.

05. සිය නිල නිවාස පරීක්ෂා කිරීම සඳහා මහාධිකරණ කළාපයට අනුයුක්ත කර ඇති තාක්ෂණික නිලධාරියාට/නිලධාරිණියට සෑම කාර්තුවකටම වරක් නිල නිවාසයට හා එය පිහිටි පරිශ්‍රයට ඇතුලුවීමට අවසර ලබාදෙන ලෙසට ඔබට දැනුම්දීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මට නියම කර ඇත.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 අගෝස්තු මස 06 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.